# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2142/44 - 2019 සැප්තැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2019.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) (අ) වගන්තිය යටතේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ අංක 03 උඩෙයාර්කට්ටු කොට්ඨාසයට තේරී පත්වූ සබාරත්තිනම් තිරුවෙල්වම් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ අංක 3 උඩෙයාර්කට්ටු කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වලර්මදි සුබාකරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, කාන්දිරාසා කාන්දීපන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් වලර්මදි සුබාකරන්, පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ අංක 3 උඩෙයාර්කට්ටු කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

කේ. කාන්දීපන්,
තේරීම්භාර නිලධාරී,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මුලතිව්.


1A - G 31075 — 27 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*